# තනතුරු පුරප්පාඩු
# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්) – MM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**(1) අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු හෝ භූ ඉංජිනේරු විද්‍යාව/භූ ගර්භ විද්‍යාව (විශේෂ) උපාධිය හෝ භෞතික විද්‍යා අංශයේ විශේෂ උපාධියක් ලබා තිබීම,

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු හෝ භූ ඉංජිනේරු විද්‍යාව/භූ ගර්භ විද්‍යාව (විශේෂ) උපාධිය හෝ භෞතික විද්‍යා සාමාන්‍ය උපාධිය සමග ක්ෂේත්‍රයට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**(2) පළපුරුද්ද :**

ඉහත අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ආපදා අවම කිරීම් සේවා සැපයීමේ වැඩසටහන් සඳහා ආපදා අවදානම අවම කිරීමේ පංචවිධ සංරචකයන්ට අදාලව ප්‍රතිඵල මත පදනම් වන ව්‍යාපෘති වාර්තා සැකසීම.
(2) තේමාත්මක වපසරියන්ට අදාලව විශේෂිත සංරචකයන් යටතේ තොරතුරු හා තොරතුරු පද්ධති පවත්වාගෙන යාම.
(3) අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා සම්පත්දායකයකු ලෙස සක්‍රීයව දායකවීම.
(4) ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් හා සැළසුම් සැකසීම සඳහා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් සමග සම්බන්ධව කටයුතු කිරීම.
(5) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා වාර්ෂික අයවැය පිළියෙල කිරීමට සහය ලබා දීම.

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

MM 1-1 - 2016- රු.53,175-10x1375-15x1910- 95,575.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) – MM 1-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම විද්‍යාව හෝ භූගෝල විද්‍යාව හෝ භූගර්භ විද්‍යාව හෝ සිවිල් ඉංජිනේරු හෝ සන්නිවේදන ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව හෝ සමාජ විද්‍යාව හෝ ස්වාභාවික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයකට අදාළව උපාධියක් ලබා තිබීම,

සහ

ඉහත ඕනෑම උපාධි පාඨමාලාවක් සමග භූ තොරතුරු විද්‍යාව ( GIS ) සහ දුර දැනීම (Remote Sensing ) විෂයක් වශයෙන් හදාරා තිබිය යුතුය. නැතහොත් එකී උපාධි පාඨමාලාවක් සමග භූ තොරතුරු විද්‍යාව (GIS ) සහ දුර දැනීම (Remote Sensing) ක්ෂේත්‍රයේ එක් වසරක පළපුරුද්දක් සහිතව වසර තුනක පළපුරුද්දක් තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම් :**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ආපදා කළමනාකරණය සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදුකිරීම.
(2) ආපදා කළමනාකරණ සම්බන්ධ ජාතික මට්ටමේ වැඩසටහන් දියත් කිරීම.
(3) ආපදා කලමනාකරණ සම්බන්ධ ජාතික මට්ටමේ දත්ත බැංකුවක් හා තොරතුරු ජාලය පවත්වාගෙන යෑම.
(4) ආපදා අවදානම් හා ප්‍රවනතා ප්‍රදේශ සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීම.
(5) දුර දැනීම ( Remote Sensing ) හා භූ තොරතුරු පද්ධති තාක්ෂණය ආපදා කළමනාකරණයට යොදා ගැනීම.
(6) ආපදා කළමනාකරණය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගැනීමට අවශ්‍ය ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීත්වය ඇති කිරීම.

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

MM 1-1 - 2016- රු.53,175-10x1375-15x1910- 95,575.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ.** **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 03. සහකාර අධ්‍යක්ෂ (පෙර සූදානම්) – MM 1-1 - තනතුරු 01

**අ.** **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**(1)** **අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් විද්‍යා හෝ වාණිජ හෝ කලා හෝ විෂය ධාරාවන්ගෙන් විශේෂ උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

**(2)** **පළපුරුද්ද :**

ඉහත අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ.** **තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ආපදා විශේෂිත වූ ප්‍රතිචාර සැළසුම් සකස් කිරීම ( සුළි සුළං, නියඟ, ගංවතුර, නාය යෑම් ).

.

(2) විවිධාකාර වූ ආපදාවන්ට ගොදුරුවිය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම, හා පෙර සූදානම් ක්‍රියාකාරකම් සැළසුම් කිරීම.

(3) ආපදා විශේෂිත වූ පොරොත්තු සැළසුම් සකස් කිරීම.

- i. තෙල් කාන්දු පිළිබඳ ජාතික සැළසුම්.
- ii. කාර්මික හා රසායනික ආපදා කළමනාකරණ ජාතික සැළසුම්.
- iii. විකිරණ හා න්‍යෂ්ටික උපද්‍රව සඳහා වූ හදිසි කළමනාකරණ ජාතික සැළසුම්.
- iv. ජලාශ, වේලි ආශ්‍රිත උපද්‍රව.
- v. හඳුනාගත් ප්‍රදේශ සඳහා කැළෑ හා නාගරික ගිනි කළමනාකරණ සැලසුම්.

(4) පාසැල් ආපදා ආරක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(5) රෝහල් හදිසි පෙර සූදානම් සැළසුම් වැඩසටහන් ස්ථාපනය කිරීම.
(6) අයවැය සැළසුම්, වාර්ෂික අයවැය වාර්තා, වාර්ෂික වැඩ සැළසුම්, ප්‍රගති වාර්තා සකස් කිරීම.
(7) පළාත්, මහනගර සභා, හා නගර සභා මට්ටමින් හදිසි ප්‍රතිචාර ධාරිතාවන් වර්ධනය හා ශක්තිමත් කිරීම.
(8) ආපදා පෙර සූදානම් සැළසුම් සකස් කිරීම, හා යාවත්කාලීන කිරීම මගින් ද්වීතියික හා ජාතික මට්ටමේ සියළුම ආපදා කළමනාකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම.
(9) ආපදා කළමනාකරණ කමිටු හා උප කමිටු ඇති කිරීම.
(10) සියළුම ප්‍රජාමූල ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා දත්ත මූලාශ්‍රයන් ගොඩනැංවීම, ආපදා සිතියම් ගත කිරීම හා පෙරහුරු අභ්‍යාස පැවැත්වීම.

**ඇ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

MM 1-1 - 2016- රු.53,175-10x1375-15x1910- 95,575.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 04. දුර දැනීම/භූ තොරතුරු පද්ධති විශ්ලේෂක - JM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මැනුම් විද්‍යාව හෝ භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-1) II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ආපදා අවධානම් විශ්ලේෂණය සඳහා කළමනාකාරිත්වයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
(2) චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය මගින් පසු ආපදා සිතියම් සකස් කිරීම.
(3) අවධානම් විශ්ලේෂණය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාව මගින් දත්ත රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය.
(4) ආපදා කළමනාකරණයට අදාළ සියළු සිතියම් සකස් කිරීම හා මුද්‍රණය කිරීම.

**ඈ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2016- රු.42,600-10x755-18x1135- 70,580.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 05. දත්ත පද්ධති විශ්ලේෂක - JM 1-1 - තනතුරු 01

### අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමග පරිගණක විද්‍යාව විෂයක් ලෙස හදාරා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත් (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ ඒම සුදුසකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහ (05)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක විද්‍යාව පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ ඒම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනක අවම වශයෙන් වසර දහය (10)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

### ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-1) II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

### ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :

(1) ආපදා අවධානම් විශ්ලේෂණය සඳහා කළමනාකාරිත්වයට අවශ්‍ය තාක්‍ෂණික සහාය ලබා දීම.
(2) පසු ආපදා හානි දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ දත්ත විශ්ලේෂණය.
(3) ආපදා කළමනාකරණය සඳහා වූ තොරතුරු පද්ධතිය ආශ්‍රිත තොරතුරු කළමනාකරණය සහ විශ්ලේෂණය.
(4) ආපදා තොරතුරු අන්තර්ජාලගත කිරීම.
(5) දත්ත පද්ධති ක්‍රම ලේඛනය (Database Programming), ජාලගත වූ තොරතුරු පද්ධති කළමනාකරණය.

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2016- රු.42,600-10x755-18x1135- 70,580.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 06. ජාල පද්ධති පරිපාලක - JM 1-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක ජාලකරණය පිළිබඳ හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ ) හත් (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවීණතා සහතික ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහ (05)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවීණතා සහතික ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහය (10)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-1) II වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

(1) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි කටයුතු සඳහා අවශ්‍ය ජාලකරණ පද්ධතීන් පවත්වාගෙන යාම, නඩත්තු කටයුතු සිදුකිරීම සහ යාවත්කාලීන කිරීම.
(2) පැය 24 පුරා ක්‍රියාත්මක වන හදිසි මෙහෙයුම් මැදිරියට අවශ්‍ය ජාලකරණ පහසුකම් සැපයීම.
(3) පැය 24 පුරා ක්‍රියාත්මක වන ජාතික හදිසි ඇමතුම් මැදිරියට (117) අවශ්‍ය වන ජාලකරණ පහසුකම් සැපයීම සහ නඩත්තුව.
(4) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සියළු තොරතුරු ගබඩා කිරීමට අවශ්‍ය දත්ත ගබඩා පද්ධති නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.
(5) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහ දිස්ත්‍රික් ඒකකයන්හී අන්තර්ජාල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම.
(6) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ජාලකරණ මැදිරියේ ස්ථාපනය කර ඇති සියළුම සර්වර් පද්ධති අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ඒවා ස්ථාවර කිරීම.
(7) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් ඒකකයන් අතර ස්ථාපිත ජාල පද්ධතිය පවත්වාගෙන යාම, නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2016- රු.42,600-10x755-18x1135- 70,580.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 07. පත්වීමේ ස්වභාවය :

අ. ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවාදායකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

ආ. බාහිර අයදුම්රුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

ඇ. අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය එක් අවුරුදු වැඩබැලීමේ කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

## 08. වෙනත් අවශ්‍යතා :

**සෑම අයදුම්කරුවෙක්ම;**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ඇ. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

## 09. අයදුම්පත් එවිය යුතු ආකාරය :

අයදුම්පත www.dmc.gov.lk වෙබ් අඩවියේ පළ කොට ඇති අතර ඒ අනුව සකස් කර ගත් අයදුම්පත් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2024.04.08 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අංක 120/2, විද්‍යා මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්කරු විසින් තම අයදුම් පත්‍රයේ "බාහිර අයදුම්කරුවෙකු" ද , "අභ්‍යන්තර අයදුම්කරුවෙකු" ද යන්න පැහැදිලිව සඳහන් කල යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, " අයදුම් කරන තනතුර" පැහැදිලිව ලියා දැක්විය යුතු වේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කිරීමේදී බාහිර අයදුම්කරුවෙකු ලෙසද අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැත.

අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහ තමා සතු සියළුම අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික යන සහතිකයන්හි පිටපත් එවීම **අනිවාර්යය වේ.** තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වග කියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවන් සිය අයදුම්පත්‍රය ආයතනයේ ප්‍රධානියා මඟින් එවිය යුතු අතර එසේ නොඑවන සහ **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසුව මෙම මධ්‍යස්ථානය වෙතට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැලකිය යුතුයි:**

මෙම දැන්වීම www.dmc.gov.lk යන වෙබ් අඩවියේද පලකොට ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය